## යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

### තනතුරු ඇබෑර්තු සඳහා බඳවා ගැනීම -

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

දකුණු පළාත් රාජ්‍ය සේවයේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | සේවා ගණය/ශ්‍රේණිය | අවශ්‍ය අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | PL 1-2016<br>රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 | ප්‍රාථමික ශිල්පීය නොවන (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණිය | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම |
| සෞඛ්‍ය කම්කරු | 02 | PL 1-2016<br>රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 | ප්‍රාථමික ශිල්පීය නොවන (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණිය | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම |
| පුස්තකාල සහායක | 01 | PL 1-2016<br>රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 | ප්‍රාථමික ශිල්පීය නොවන (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණිය | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06)ක් සමත් වී තිබීම |
| මෙම වැටුප් පරිමාණයන්ට අදාළ මූලික වැටුප ගෙවනු ලබන්නේ 2020.01.01 දින සිට වන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි සඳහන් උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලබයි. | | | | |

02. *වයස් සීමාව :*

i. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු සහ අවු. 45ට නොවැඩි විය යුතු ය.
ii. දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවය කරන අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. *පොදු සුදුසුකම් :*

i. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
ii. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න අවම වශයෙන් වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
iii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
v. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

04. *පොදු කොන්දේසි :*

i. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවෙහි හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සතු ය.
ii. තෝරාගනු ලබන අයදුම්කරුවන් මාස 03ක් තුළ රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයෙන් ශාරීරික හා මානසික වශයෙන් නුසුදුසු බැව් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.



05. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

ii. තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

iii. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසිවලට හා රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද දකුණු පළාත් සභාව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුව කටයුතු කිරීමට ඔබ බැඳී සිටිය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමවේදය :*

සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

*07. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය :*

| | ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | අමතර සුදුසුකම් (උපලේඛන 2ට අනුව අදාළ නම්) | 10 | |
| 3 | පළපුරුද්ද (උපලේඛන 2ට අනුව අදාළ නම්) | 10 | |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරක ලකුණු 5 බැගින්) | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

08. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුනා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් සහ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

i. උප්පැන්න සහතිකය,

ii. අධ්‍යාපන සහතික,

iii. පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනයේ පිටපතක් හා මෑතක දී ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් තබන ලද ග්‍රාම සේවා සහතිකයක්,

iv. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්,

v. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික,

vi. සාපරාධී වරදක් සම්බන්ධයෙන් මෙතෙක් උසාවියකින් වරදකරුවෙකු කර නැති බව සහ එවැනි වරදක් සම්බන්ධයෙන් දැනට පරීක්ෂණයකට භාජනය නොවන බවට පොලිස් සහතිකයක්,

vii. ඉහත සඳහන් තනතුරුවල මෙම ආයතනයේ ආදේශක, අනියම්, තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන්නන් සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇතුළත් වන ආකාරයට A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් තමා විසින් සකස් කරගන්නා අයදුම්පත් 2019.04.12 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''ලේකම්, ප්‍රාදේශීය සභාව, යක්කලමුල්ල'' යන



ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. එක් අයදුම්කරුවෙකුට තනතුරු 03ටම වුව ද අයදුම්කළ හැකි අතර එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. සඳහන් කර ඇති උපදෙස්වලට පටහැනි සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

යූ. ජී. පියදාස,
සභාපති,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2019 පෙබරවාරි මස 28 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව, යක්කලමුල්ල.

03-1172

Source: Government Gazette (2019.03.22)